# බදුලු ප්‍රදේශයේ අංකෙළිය පිළිබඳ ජනශ්‍රැති අධ්‍යයනයක්

**එන්.එල්.එන්. පුෂ්පමාලී පෙරේරා**[1]

ජනශ්‍රැතිය වූ කලී පුළුල් විෂය ක්ෂේත්‍රයකි. එහි බහුවිධ ප්‍රභේදයන් අතර ජනක්‍රීඩා එකකි. මෙහි දී විමර්ශනයේ පහසුව උදෙසා ජන ක්‍රීඩා වර්ගකරගත හැකි අතර ඉන් "අභිචාරාත්මක ජන ක්‍රීඩා" ගණයට "අංකෙළිය" ඇතුළත් කළ හැකිය.

ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය වශයෙන් ජනතාව විසින් ලෞකික ආරක්ෂණය සඳහා සංවිධානය කරගත් සංස්කෘතිකාංග රැසක් වේ. මේවායින් බහුතරයක් යක්ෂ, දේව, භූත ආදී අදෘශ්‍යමාන බලවේග කෙරෙහි පවත්නා අධි විශ්වාසය පදනම් කොට පවතී. අංකෙළිය එසේ ලෞකික ආරක්ෂණය උදෙසා පත්තිනි දේවිය විෂයෙහි සිදුකෙරෙන්නා වූ ජනක්‍රීඩාත්මක යාතු කර්මයක් වන්නේය.

කෘෂිකාර්මික සශ්‍රිකත්වය මත යස ඉසුරු තීරණය වූ ගැමි ජන දිවියෙහි වගාව සඳහා වූ වැසි ලබාගැනීමත්, නියං කාලයේ ඇතිවන වසංගත රෝග මර්ධනයත්, ගව මහීෂාදීන් ආරක්ෂා කර ගැනීමත්, දරු පැටව් රැකගැනීමත් මෙම යාතු කර්මයේ මුඛ්‍ය පරමාර්ථයන් විය. මෙම ස්වාභාවික ව්‍යසනයන් පත්තිනිය කෝපවීමෙන් සිදුවන බව විශ්වාස කරමින් ඇයගේ අතීත විනෝද මාර්ගයක් වූ "කෙකි ඇදීම" ස්මරණය කරමින් ඇය සතුටු කිරීමෙන් ශාන්තිය අපේක්ෂා කෙරේ. මෙම පරමාර්ථ සාධනය සඳහා වූ බදුලු පුර අංකෙළියෙහි ක්‍රියාත්මක ස්වරූපය හා අනන්‍යතා ලක්ෂණ හඳුනාගැනීම මෙහි දී අපේක්ෂා කෙරේ.

**ප්‍රමුඛ පදඃ** ජනශ්‍රැතිය, ජනක්‍රීඩා, අංකෙළිය, පත්තිනි, බදුල්ල

**Title:** A study of the "Ankeliya", a ritualistic game practised in the Baddulla region

**Keywords:** Folklore, Folk games, Ankeliya, Pattini, Badulla

[1] සිංහල අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය
ඊමේල්: pushpamaliperera@yahoo.com